# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

කාලය පැ. 3 යි.

( I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)

### I කොටස

01. i. අ) ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ ඉතා වැදගත් ගැටලුව කුමක් ද?

.......................................................................................................

ආ) විනය ශික්ෂාවන්හි දැඩිව එල්බ ගත්තේ කවර සම්ප්‍රදායක්ද?

.......................................................................................................

ii. අ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළ බව සඳහන් වන්නේ කවර නිකායික ග්‍රන්ථවල ද?

.......................................................................................................

ආ) පුරාණ තෙරුන් ප්‍රථම සංගීතිය ප්‍රතික්ෂේප කළේ ඇයි?

.......................................................................................................

iii. අ) වජ්ජි භික්ෂූන්ට එරෙහිව ක්‍රියාත්මක වූවෝ කවරහු ද?

.......................................................................................................

ආ) ඔවුන් එසේ වජ්ජි භික්ෂූන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට බලපෑ හේතුව කුමක් ද?

iv. අ) පංච වස්තුව ඉදිරිපත් කළේ කවරෙක් ද?

.......................................................................................................

ආ) පංච වස්තුව නිසා බුද්ධ ශාසනයේ මතු වූ අර්බුධකාරී තත්ත්වය කුමක් ද?

.......................................................................................................

v. අ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියුවේ කවරෙක් ද?

.......................................................................................................

ආ) ඔහු ඉදිරිපත් කළ ඓතිහාසික සිදුවීම කුමක් ද?

.......................................................................................................

vi. අ) "පුද්ගල සංකල්පය" යනු කුමක්ද?

.......................................................................................................

ආ) අශෝක රජුගේ රණශූරත්වයත්, ස්වකීය විජයග්‍රහණයෙන් පසු, පසුතැවෙන ආකාරයත් හෙළිකරන සෙල්ලිපිය නම් කරන්න.

.......................................................................................................

vii. අ) මුළු මහත් ත්‍රිපිටකයම අළලා බුද්ධඝෝෂ හිමියන් ලියූ කෘතිය කුමක් ද?

.......................................................................................................

ආ) මේ කෘතිය ලිවීමට ආරාධනා කළේ කවරෙක් ද?

.......................................................................................................



Scanned by CamScanner

viii. අ) නාලන්දා විශ්ව විද්‍යාලය පිහිටියේ භාරතයේ කවර ප්‍රදේශයක ද?

...................................................................................................................................

ආ) මේ ආයතනයේ ප්‍රමුඛස්ථානය හිමි වූයේ කවර බෞද්ධ සම්ප්‍රදායක් සඳහා ද?

...................................................................................................................................

ix. අ) අශ්වඝෝෂ හිමියන් විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කරන ලද දෘශ්‍ය කාව්‍යයේ නම කුමක් ද?

...................................................................................................................................

ආ) මේ හිමියන් විසූයේ කවර රාජ්‍ය සමයේ දීද?

...................................................................................................................................

x. අ) මහින්දාගමනයට පෙර මෙරට තනන්නට ඇතැයි සිතිය හැකි ස්තූප දෙකක් නම් කරන්න.

...................................................................................................................................

ආ) මහින්දාගමනයෙන් පසු මෙරට ගොඩනංවන ලද ප්‍රථම ස්තූපය කුමක් ද?

...................................................................................................................................

Scanned by CamScanner

# 2559 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

S 4

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

### II කොටස

2. (i) කණිෂ්ක රජු බුදුදහම වැළඳ ගත් ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) කණිෂ්ක රජුගේ ආගමික සේවාව ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) විභාෂා ග්‍රන්ථ යනු කවරේ දැයි හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

3. (i) ථෙරවාදීන් හා මහායානිකයන් සංසාර විමුක්තිය උදෙසා අනුගමනය කළ ඒකායන මාර්ග පිළිබඳ සංසන්දනාත්මක විවරණයක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) ථෙරවාද හා මහායාන දෙකෙහි බුද්ධ සංකල්පය ආශ්‍රිතව පවත්නා මතවාද විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) "පොදුජන සිතුම් පැතුම්වලට වඩාත් නැඹුරු වූයේ ථෙරවාදයට වඩා මහායානයයි" විමසන්න. *(ලකුණු 06 යි)*

4. (i) වලභී විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) හියුං සියැං හා ඉට්සිං යන සංචාරකයින් මේ විශ්වවිද්‍යාලය ගැන පළ කරන අදහස් සමාලෝචනය කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මේ විශ්වවිද්‍යාලයේ ඉගැන් වූ අධ්‍යාපන විෂයමාලාව ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ශ්‍රී ලංකාව හා මියන්මාරය (බුරුමය) අතර පැවති පැරණි ආගමික සබඳතා ගැන විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) මියන්මාරයට බුදුදහම හඳුන්වා දීම පිළිබඳ පවත්නා මතවාද පිරික්සන්න. *(ලකුණු 06 යි)*
   (iii) "කල්‍යාණි ශිලාලිපිය" මගින් හෙළි කරන තොරතුරු මියන්මාරයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද බෞද්ධයන්ට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) ප්‍රාග් මහින්ද යුගයේ දී මෙරට වාසය කළ විවිධ ජනවර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) ඉහත සඳහන් කාලය තුළ ශ්‍රී ලංකා සමාජයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) මහින්දාගමනයත් සමග යථෝක්ත ආගමික ඇදහිලි හා විශ්වාස නව මුහුණුවරක් ගනිමින් විකාශනය වූ ආකාරය විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) බුදුසමයේ දියුණුව හා චිරස්ථිතිය උදෙසා දුටුගැමුණු රජතුමාගෙන් සැලසුණු සේවය ඇගයීමට ලක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) "මහජන සුබසාධනය හා සෞඛ්‍යය සඳහා පැරණි ශ්‍රී ලාංකික පාලකයන්ගෙන් ලැබුණේ නොමඳ අනුග්‍රහයකි." පිරික්සන්න. *(ලකුණු 06 යි)*
   (iii) මහසෙන් රාජ්‍ය සමයෙහි ථෙරවාදයේ චිරස්ථිතියට හානිකර වූ මහායාන බලවේග ශ්‍රී ලංකාවේ පැතිර ගිය ආකාරය විභාග කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) බුදුපිළිම නිර්මාණයේ ආරම්භය හා විකාශනය ආශ්‍රිතව පවත්නා මතවාද පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*
   (ii) මථුරා හා ආන්ධ්‍ර බුදුපිළිම නිර්මාණයේ දක්නට ලැබෙන විශේෂතා පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*
   (iii) බුදුපිළිමවල මුද්‍රා භාවිත කිරීමේ අරමුණු හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ බහුලව යොදා ඇති මුද්‍රා හා ඊට අදාළ පිළිම පිහිටි ස්ථාන කවරේ දැයි දක්වන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner